**බලංගොඩ ප්‍රාදේශීය සභාව**

**රත්නපුර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 පෙබරවාරි 27 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 28 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ජූලි 03 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මගේ පරික්ෂණයෙන් පෙනි යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව , බලංගොඩ ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට බලංගොඩ ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිලිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මු දල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

(අ) සමාලෝචිත වර්ෂයේ සෘජු ශ්‍රමය යටතේ ඉටු කළ කර්මාන්ත වලින් සහා වාහන කුලී වශයෙන් ලැබිය යුතු රු 208,400 ක් සභාවේ ආදායමක් සහ ණය ගැතියන් යටතේ ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) ලෙජර් ගිණුම් දෙකක් සහ අදාළ ලේඛන අතර වෙනස වූ රු 304,884 ක් හඳුනා ගෙන නිවැරදි කිරිමට කටයුතු කර නොතිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු 4 ,213 ,556 ක් වූ ගනු දෙනු විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2 මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

### 2.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු 2,143,983 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු 3,382,684 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය.

### 2.2.1 ඇස්තමේන්තු ගත ආදායම් තථ්‍ය ආදායම් හා හිග ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම් හා හිග ආදායම් පිලිබද තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000` | රු. 000` | රු. 000` |
| (i) | වරිපනම් හා බදු | 530 | 612 | 117 |
| (ii) | බදු කුලි | 128 | 116 | 86 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 29 | 29 | 110 |
| (iv) | වෙනත් ආදායම් | 16,579 | 19,404 | 8,768 |

**2 .2 .2 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පලාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු |
|---|---|
| (i) උසාවි දඩ | 916,125 |
| (ii)මුද්දර ගාස්තු | 7,166,160 |

**2.3 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්**

(අ) බලංගොඩ ප්‍රාදේශිය ලේකම්ට අයත් කල්තොට ගොවි ජන සේවා මධ්‍යස්ථානය භාරයේ පැවැති ට්‍රැක්ටර් රථ සහ වෙනත් උපකරණ විෂයයන් 31 ක් රත්නපුර දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ තිරණය පරිදි 2010 අගෝස්තු 23 දින සභාවට පවරා දී තිබූ අතර 2012 දෙසැම්බර් 31 දින දක්වාම කිසිදු ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුනි.

(ආ) සභාව සතු රු.16,641,000 වටිනා වාහන හා යන්ත්‍ර සූත්‍ර සභා භූමියේ තැනින් තැන ආවරණයක් නොමැතිව අනාරක්ෂිතව ගාල් කර තිබුණි.

**2.4 ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය**

රජවක යෝජිත කසල බැහැර කිරිමේ ව්‍යාපෘතිය වටා ආරක්ෂිත බැම් ඉදි කිරිමේ කර්මාන්තය සඳහා රු 990,250 ක වටිනාකමින් යුත් ගිවිසුමකට 2010 ජුලි 26 දින එළඹ තිබුණු අතර 2010 ඔක්තෝබර් 05 දින රු 198,152 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. ඉදි කිරිම් භූමිය වටා අත්තිවාරම් බැම් බැද ඒ මත අඩි 4ක් උසට සිමෙන්ති ගල් වලින් ආරක්ෂිත බැම්ම ඉදි කර තිබුනු අතර එ ලෙස ඉදි කර තිබුණු බැම් කොටස් කිහිපයක් ගම් වැසියන් විසින් පෙරලා දමා ඇති බව 2011 ජනවාරි 12 දින කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී අනාවරණය විය.කෙසේ නමුත් මේ දක්වා කසල බැහැර කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු නිම කර නොතිබුණි.

**2 .5 අරමුදල් ඌන උපයෝජනය**

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදිත මුදල් මුළුමනින්ම උපයෝජනය කර නොතිබූ වැය විෂයන් 25ක එකතුව රු 1,981,000 ක් විය.

**3. පද්ධති හා පාලනය.**

**----------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අයවැය පාලනය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) ප්‍රතිපාදන උපයෝජනය

(ඈ) ගබඩා පාලනය